ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් ෑ
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

බෞද්ධෝදය

"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරි"



72 වර්ෂය - ශ්‍රී බු.ව 2561 2017 ජුනි 08 පොසොන් කලාපය

# ක්ෂාන්තිවාදී ජාතකය

## ශාස්ත්‍රපති ඌරුගමුවේ අස්සජි හිමි

ඉවසීම සෑම පුද්ගලයෙකුම මැනවින් ප්‍රගුණ කළ යුතු ඉතා උසස් ගුණ ධර්මයකි. ඉවසීමේ සීමාව ඉක්මවායාම නිසා ඇති වන අධික කෝපය හා ක්ෂණික කෝපය නිසා සමාජ ගැටලු බොහොමයක් හට ගනියි. මනුෂ්‍ය ඝාතන, සියදිවි නසා ගැනීම, පොදු දේපොල විනාශ කිරීම, කලකෝලාහාල හා රථවාහන අනතුරු යනාදී ව්‍යසනයන් බොහොමයකට ප්‍රධාන හේතුවක් වන්නේ ඒ ඒ පුද්ගලයන් සතු ඉවසීමේ ගුණයේ පවත්නා දුර්වලතාවයන් ය.

අප මහා බෝසතාණන් වහන්සේ පිරූ දස පාරමිතා අතර ''ඛන්ති'' යනුවෙන් සඳහන් වන්නේ මෙම ඉවසීමේ ගුණාංගයයි. සිංහල ජනතාව අතර ''ඉවසීමෙන් සැනසීම ලැබේ'' යන අගනා ප්‍රස්තා පිරුළක් ද ප්‍රකටව පවත්නේ එය බෙහෙවින්ම මිනිස් සමාජයේ යහපැවැත්ම සඳහා හේතුවන බැවිනි. එබැවින් ඉවසීම මුලු මහත් සමාජයටම මනා ආලෝකයක් සපයයි.

අප මහා බෝසතාණන් වහන්සේ ඉවසීම මැනවින් ප්‍රගුණ කළ ආකාරය දක්වෙන ජාතක කතාවක් ලෙස ''ක්ෂාන්තිවාදී ජාතකය'' හඳුන්වා දිය හැකි ය.

**වර්තමාන කතාව**

එකල බුදු රජාණන් වහන්සේ වැඩසිටියේ සැවැත්නුවර ජේතවනාරාමයේ ය. නිතර කෝප සහගතව හැසිරෙන භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ එහි දී බුදුරදුන්ට

දූත ගැන්මට ලැබුණි. එම භික්ෂුව කැඳවූ උන් වහන්සේ ඊට හේතු විමසූ හ. පසුව එම භික්ෂුව අමතමින් ''පෙර උත්තමයෝ අත් පා කන් නාසා කැපීම ආදී ඉතා දරුණු වධ හිංසා කරද්දීත් කෝප නොවී සිටියාහු'' වේ යැයි වදාළ හ. පසුව භික්ෂූන් වහන්සේලාගේ ආරාධනයෙන් ඉකුත් වත් ගෙනහැර දක්වා වදාළ සේක.

**අතීත කතාව**

යටගිය දවස කසී රට කලාබු නම් රජ කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි අප මහා බෝසතාණන් වහන්සේ බමුණු කුලයක උපන්නා හ. නමින් ''කුරුණ්ඩක කුමරු'' යැයි ප්‍රකට විය. තිසි කල ශිල්ප ශාස්ත්‍ර මැනවින් හදාරා දෙමව්පියන් ගේ ඇවෑමෙන් ඔවුනගේ සියලු සම්පත්වලට උරුමකරු වූ කුරුණ්ඩක කුමරු පංච කාමයෙහි ආදීනව දක එකී සියලු සම්පත් දාන විෂයෙහි විසිරුවා හැරියේ ය. පසුව ඍෂි ප්‍රව්‍රජ්‍යාව ලබා හිමාලය වනයෙහි කලක් වාසය කොට බරණැස් නුවරට පැමිණ රජ උයනෙහි නවාතැන් ගත්තේ ය. පසුදින තවුස්තුමා පිණ්ඩපාතයේ හැසිරෙණු රජුගේ මහසෙනෙවිතෙමේ දුටුවේ ය. ඔහු ස්වකීය නිවසට තවුස්තුමා කැඳවාගෙන ගොස් දානමානාදිය පිරිනමා සංග්‍රහ කොට එම රාජ උයනෙහි ම වැඩ සිටීමට අවස්ථාව සලසා දුන්නේ ය.

මේ අතර එක් දිනක් කලාබු රජු නාටක ස්ත්‍රීන් පිරිවරා උයන් කෙළියට පැමිණ ඔවුනගේ නැටුම් ගැයුම් බලමින් ගිමන් වෙහෙස හරිමින් සිටින අතර නින්දට වන්නේය. ඒ දුටු නාටක ස්ත්‍රීහු අප ගේ ස්වාමීන් නිදන කල අපි කුමට නැටුම්, ගැයුම්, වැයුම් කරමුදැයි, කතිකා කළ හ. පසුව එක් ස්ත්‍රියක් පමණක් රජු සමීපයෙහි නවතා අවශේෂ පිරිස උයන්සිරි නැරඹූ හ. එසේ ගමන් කරන අතර කිසියම් ගසක් මුල වැඩසිටින ක්ෂාන්තිවාදී තාපසතුමා දුටුවහ. තාපසතුමා වටා රැස් වූ ඔවුහු කිසියම් බණක් දේශනා කරන ලෙස ඉල්ලා සිටිය හ. තවුසාණෝ බණ දෙසූ හ. තමා තනිකර ගොස් සෙසු පිරිස තවුස්තුමා සමීපයෙහි බණ අසනු දුටු ස්ත්‍රිය රජු අවදි කරවූවා ය. තමන් හා කැටිව ආ සෙසු ස්ත්‍රී පිරිස නොදුටු රජු ඔවුන් කොහි ගියා දැයි, ඇය ගෙන් විමසීය. අසවල් ස්ථානයේ ගසක් යට තාපසතුමෙකු සමීපයෙහි ඔවුහු බණ අසති යි, ඇය පිළිතුරු දුන්නා ය.

එයින් කිපුණු රජු කඩුව අමෝරා ගෙන තාපසතුමා මැරීමට වහා දිව ගියේ ය. වල්ලභ ස්ත්‍රීහු එක්ව කඩුව ගත් හ. ඉක්බිති රජු තාපසතුමා ගෙන් ''තොප කිනම් වාදී දැ''යි ප්‍රශ්න කළේ ය. තාපසතුමා ගේ පිළිතුර වූයේ ''මම ක්ෂාන්තිවාදී වෙමි'' යි යන්න ය. ක්ෂාන්තිය යනු කුමක්දැයි රජු විමසීය. තමාට කෙනෙකු දොස් නගද්දී හිරිහැර කරද්දී නොකිපේ නම් එය ක්ෂාන්තිය බව තාපසතුමා කියා සිටියේ ය. තොප ළඟ ක්ෂාන්තියක් තිබේ දැයි බලන්නෙමි යි, පැවසූ රජු වධකයෙකු ගෙන්වා මෙම සොර තවුසා බිම හොවා කස පහර දෙව'යි අණ කළේ ය. වධකයා ගේ කස පහරින් තුවාල ලත් තාපසතුමා ගේ ඇඟෙන් ලේ ගලන්නට විය. එය දුටු රජු ''දැන් තොප කිනම් වාදී දැ''යි ඇසී ය. ''මහරජ, මම ක්ෂාන්තිවාදී වෙමි. මගේ ඉවසීම සිතු තුළ පවත්නා දෙයක් මිස ඇඟෙහි සමෙහි ඇති දෙයක් නොවේ.'' යැයි, තාපසතුමා පිළිතුරු දුන්නේ ය.

ඉක්බිති රජු ''එසේ නම් ඔබ ගේ එම ක්ෂාන්තිය ද බලමි''යි, කියා තාපසතුමා ගේ දෙඅත්, දෙපා කැප්පවීය. එසේ සිදු කළත් තාපසතුමා ගේ ක්ෂාන්තියේ කිසිදු වෙනසක් සිදු නොවීය. අනතුරුව කන් නාසා කැපීමට නියම කළේ ය. එහි දී ද තාපසතුමාගේ පිළිතුර වූයේ තමාට කෙනෙක් වධහිංසා කළත් රජු කෙරෙහි තමා මෙත් වඩන බව ය. ''මාගේ ක්ෂාන්තිය අත පය කන් නාසාවල පවත්නා දෙයක් නොව, එය මාගේ සිත තුළ පවත්නා දෙයකැ''යි, තාපසතුමා ප්‍රකාශ කළෙන් එයින් රජු වඩ වඩාත් කෝපයට පත් විය. ''එම්බල සොර තාපසය, තොපගේ ක්ෂාන්තිය තොපම තබා ගනු යැ''යි, කියා විලුඹෙන් තාපතුමාගේ ළයට ඇන එතැනින් ඉවත්ව ගියේ ය. එම අපරාධය හේතුවෙන් රජු අපාගත වූයේ ය.

ඉක්බිති සෙනෙවි තෙමේ තාපසතුමා සමීපයට එළඹ ඇඟ ලේ පිසදමා සෙමෙන් හිඳුවා වැඳ වැටී ''මේ කළ අපරාධය රජු කළ දෙයක් මිස, තමාවත් රටවැසියන්වත් කළ දෙයක් නොවන හෙයින් අප කෙරෙහි නොකිපෙනු මැනවැ''යි, කියා සිටියේ ය. එය ඇසූ තාපසතුමා ''සෙනෙවිතුමනි, කලාබු රජු අනවබෝධයෙන් මට වධ හිංසා කළත් මා සිත ඔහු කෙරෙහි කිසිදු වෛරයක් නොමැත. රජුට සෙතක් වේවා අපි වැනි අය කිසි විටෙකත් නොකිපෙන්නෝ වෙමු''යි, සැමට මෙත් වඩා

සුළු වේලාවකට පසු මිය පරලොව ගියේ ය. සෙනෙවිතුමා නුවරවැසියන් සමග එක්ව තාපසතුමාගේ ආදාහන කටයුතු නිම කළේ ය. එසමයෙහි කලාබු රජු නම් දැන් දේවදත්ත තෙරුන් ය. සෙනෙවිතුමා නම් සැරියුත් මහ රහතන් වහන්සේ ය. ක්ෂාන්තිවාදී තාපසතුමා තිලෝගුරු බුදු වූ මම ම වේ යැයි, දක්වමින් අතීත පුවත වදාරා අවසන් කළ සේක.